සැරෙන් සැරේ මේ ලෝකෙන් ඒ ලෝකෙට, ඒ ලෝකෙන් මේ ලෝකෙට යනව ඇති. අපේ කාලේ නරක් වෙනකොට මැරිච්ච මිනිස්සුත් පණ ගහන්ඩ පටන් ගන්ඩ බැරි කමක් නෑ”

මැරෙන්න ආසන්නව සිටින්නෙකුගේ මරණය සිදු නොවීම ගැන පසු තැවිලි වන මිනී පෙට්ටි ව්‍යාපාර ක්ෂේත්‍රයේ රැඳී සිටින්නන්ගේ ජීවන පසුබිම හුදෙක් මුදල් මත ම රැඳී පවත්නා බැව් රූපණය කොට ඇත්තේ වාණිජත්වය විසින් දරදඬු කරන ලද ධනපති සමාජ තන්ත්‍රය සදය උපහාසයට ලක් කරමිනි. ජීවත්වීම සඳහා ව්‍යාපාරිකයින්ගේ අතකොළු බවට පත් වී සිටින “හැන්ඩි” බඳු සහචරයෙකුගේ ජීවිත ක්‍රියාවලිය ධනපති සමාජ ව්‍යුහයේ ජීවත්වීමේ අර්බුදයට මුහුණ දීමට සිදුවන හැන්ඩි බඳු අසාමාන්‍ය වාණිජ මනසක් ඉස්මතු කරන සාමාන්‍ය පුද්ගලයන්ට පවතින ක්‍රමයට නතුව හැඩ ගැසෙණු මිස වෙන කළ හැකි දෙයක් නොමැති ය යන්න ලේඛකයා සියුම් සේ ධ්වනිත කර ඇත.

ජීවිතයෙන් වැඩිම කාලයක් සාහිත්‍ය විචාරය හා රසාස්වාදය විෂයෙහි යොමු කළ හා යොමු කරන මහාචාර්ය කුමාරසිංහගේ කෙටිකතා විචාර කලාව පිළිබඳ මහාචාර්ය නන්දසේන රත්නපාල මහතා පවසා ඇති කරුණු රැසක් අපේ මතකයට නැගෙයි. “විචාරකයෙක් හැටියට ඒ මහතා සතු අන් බොහෝ විචාරකයන්ට නැති වැදගත් ගුණාංග කිහිපයක් වෙයි.

* සාහිත්‍ය විචාර මූලධර්ම පිළිබඳ අවබෝධය
* හේතු සාධක දක්වමින් තමන්ගේ මතය තහවුරු කිරීම.
* ආක්‍රමණශීලී හා අන්‍යයනට පහර දෙන විචාර ක්‍රමයක් හෝ දර්ශනයක් පිහිට කර නොගැනීම.
* අපක්ෂපාත, සංයමයෙන් යුත් විඥානය
* ඉතා විස්තර සහිත කාරණා අඩංගු වූ විචාර විවරණය

ඉතා ප්‍රසන්න ශෛලියකින් හා සානුකම්පික දෘෂ්ටියකින් විචාර කාර්ය සිදු කරන ඒ මහතා සාහිත්‍ය නිර්මාණයේ කලාත්මක අගය ගැන මිස ඒ කතාව රචනා කළ පුද්ගලයා සම්බන්ධ සාහිත්‍ය සීමාවලින් එහා, කෙටිකතා පරමාර්ථයට නොවැදගත් කාරණා ගැන තම උනන්දුව යොමු නොකරයි.”

අද කෙටිකතා විචාරය වෙනුවට කෙරෙන්නේ තමා දන්නා හඳුනනා අයගේ නිර්මාණ සඳහා ප්‍රශස්ති ලිවීම ය. තමාගේ කණ්ඩායමට නැති අයගේ නිර්මාණ හෙළා දැකීම ය. භෂ්ට විචාරකයින් අතර මහාචාර්ය කුමාරසිංහ අත්තුකංසනයෙන් හා පරවම්භනයෙන් විනිර්මුක්තව විචාර කාර්ය කරගෙන යෑම අපි අගය කරන්නෙමු.

සිංහල කෙටිකතාවේ අභිවර්ධනය විෂයෙහි දිවා රෑ දුක් විඳිමින් කෙටිකතා පොත පත කියවා විචාර කලාව භාවනාවක් සේ ප්‍රගුණ කළ මහාචාර්ය කුමාරසිංහගේ සමස්ත විචාර කෘති සම්භාරය විවේක බුද්ධියකින් යුතුව පරිශීලනය කිරීමේ දී අප දුටු ප්‍රශස්ත ලක්ෂණ සේම ඌණතා ද නැත්තේ නොවේ.

‘යමක් කරන්නට පුළුවන් අය එය කරති. බැරි ම අය උගන්වති.”

# 25

## මහාචාර්ය කුලතිලක කුමාරසිංහ හා විචාර ක්ෂේත්‍රය

*මහාචාර්ය මිණිවන් පී. තිලකරත්න*

ළඟින්ම පිහිටි භාරතයේ ඉතා දියුණු මට්ටමකට පත් වූ විචාර කලාවක් ඈත අතීතයේ සිට පැවතියත් එහි ප්‍රබල ආභාසයක් මෙරටට නොලැබුණේ ඇයි යන ප්‍රශ්නයට තවමත් පිළිගත හැකි පිළිතුරක් ලැබී ඇතැයි කිව නොහැක. මේ ප්‍රශ්නයට පමණක් නොව පාරම්පරිකව උරුම වී ආ නාට්‍ය කලාවක් අපට නැත්තේ ඇයි වැනි ප්‍රශ්නයකට වුවද නිතර ලැබෙන්නේ “බුදු දහම”යන ලෙහෙසි පිළිතුරයි. එහි යම් සත්‍යයක් ගැබ් වී තිබිය හැකි වුවද සම්පූර්ණ සත්‍යය එය විය නොහැකි හෙයින් මෙවැනි කරුණු පිළිබඳව ගැඹුරින් පර්යේෂණ කොට සොයා බැලීම වියතුන්ට පැවරෙන කාර්යය භාරයක් වී පවතී.

නාට්‍ය කලාව පිළිබඳ ව කෙසේ වෙතත් සාහිත්‍ය විචාරය පිළිබඳව පැවති තත්ත්වය කෙබඳු විණි දැයි යම්තමින් හෝ අනුමාන කරගැනීමට එක්රැස් කරගත හැකි කරුණු සිංහල සාහිත්‍ය ඉතිහාසයේ ඒ තරම්ම හිඟ නැත.

සීගිරි කැටපත් පවුරෙහි ගී ලියූ ඇතැමුන් එකිනෙකාගේ ගී විවේචනයට ලක්කොට ඇති සැටියෙනුත් ප්‍රකට වන්නේ ඔවුන් ගී රචනයෙහි යෙදෙන අතර ම එක්තරා විචාර කාර්යයක ද යෙදී ඇති සැටියි.

කිසියම් කාව්‍යයක ඇති “මඳ දොසුදු” සෙවීම අවශ්‍යයෙන් ම කළයුත්තක් සේ දැක්වීමෙන් සියබස්ලකර කතෘ අවධාරණයට ලක් කරන්නේ විචාරයෙහි ඇති අවශ්‍යතාව යි. “සාහිත්‍ය විචාරය” වෙනුවට පෙර යුගවල දී සම්මතයෙහි ආ “කාව්‍යවල දොස් සෙවීම” යන වහර මෙරට විචාර කලාවක් වර්ධනය නොවීමට හේතු වූ එක් කරුණක් විය හැකියි. පද්‍ය නිර්මාණය සඳහා ගත යුත්තේ බුදු සිරිතයි යන පාරම්පරික සම්මතයට ගරු කරමින් මෙරට කවීන් බුදු සිරිත නැතහොත් බෝධිසත්ව සිරිත ඇසුරු කරමින් කාව්‍ය රචනා කළ අතර ඒ කාව්‍යවල “දොස් සෙවීමට” සැදැහැයෙන් යුත් පඬිවරුන් මැළිවීම පුදුමයට කරුණක් නොවේ. එසේ “දොස් සෙවීම” කරනවා නම් කළ යුත්තේ කවීන් විසින් මය යනු මෙරට ඇතිවූ තවත් සම්මතයකි. “කවිහුම දනිති ගුණදොස” (කාව්‍යශේඛරය, 28) “කිවි පද බැඳුම් ගුණදොස් කිවිඳුන්ට ම මිස-නැණමඳ කුකවි දැනගත හෙති කවර ලෙස” (සුභාෂිතය, 8) යන යෙදුම්වලින් මේ බව ප්‍රකට වෙයි.

ග්‍රන්ථ විචාරය පිළිබඳ සැබෑ උනන්දුවක් මෙරට ඇති වූයේ දහනව වැනි සියවසේ දෙවන භාගයේ දී නොයෙක් ආකාරයේ වාද විවාද බහුලවීමත් සමඟ ය. ඒ යුගයේ දී විශාල වශයෙන් බිහිවන්නට වූ පුවත්පත්වල සමකාලීන ග්‍රන්ථ ද විචාරයට ලක්කරන ලදි. මුල් යුගයේ දී එසේ ග්‍රන්ථ විචාරයට ලක් කිරීම හඳුන්වන ලද්දේ "අමුතු කරන පොත්වල ගුණදොස් දැක්වීම" යන වචනවලිනි. "ගුණදොස් දැක්වීම" යන පැරණි යෙදුම මේ යුගයේ පුවත් පත්කරුවන් විසින් ද යොදාගන්නා ලද සැටියෙන් පෙනේ.

කාව්‍යාලංකාරය යන නමින් පළ වූ පොතක් ගැන 1882 සැප්තැම්බර් මස 1 වෙනි දින **ලක්මිණි පහන** පත්‍රයෙහි එවැනි "ගුණදොස් දැක්වීමක්" කරන අතර එක් විචාරකයෙක් අවසානයේ දී මෙවැනි නිගමනයකට ද බසියි. "යමක ගුණ පක්ෂය දක්වා අගුණ පක්ෂය නොදැක්වුවහොත් අගතියක් වන නිසා මේ පොතේ ස්වල්ප දෝසයක් දැක්වීමු." මින් පෙනෙන්නේ එක්දහස් අටසිය අසූ ගණන් වන විටත් ග්‍රන්ථ විවේචනය කෙබඳු ආකාරයෙන් විය යුතු ද යන්න පිළිබඳ ව මඳ අවබෝධයක් සිංහල වියතුන්ට ලැබී තිබුණු බවයි.

1851 දී **ජේම්ස් ද අල්විස්** සිදත් සඟරාව ඉංග්‍රීසියට පරිවර්තනය කරමින් එම ග්‍රන්ථයට සිංහල සාහිත්‍යය පිළිබඳ හැඳින්වීමක් ඉංග්‍රීසියෙන් ඉදිරිපත් කරයි. පිටු 285 ක් වූ ඒ කොටස සිංහල සාහිත්‍යය පිළිබඳව (ඉංග්‍රීසියෙන් වුවද) කරන ලද මුල්ම විචාරාත්මක විස්තරය ද වෙයි.

වාද ගණනාවකට මුල් වූ **සව්සත්දම්** වාදයට මුල පිරුණේ ද මේ විස්තරයෙහි ආ එක් ප්‍රකාශයකි. 1907 දී **ඩබ්ලිව්. එෆ්. ගුණවර්ධන** විසින් පළකරන ලද **ගුත්තිල කාව්‍ය වර්ණනා** නම් කෘතියට එක් කරන ලද අලංකාර දර්ශනය නම් විචාරාත්මක කොටස ද මෙරට සාහිත්‍ය විචාරයෙන් ඉතිහාසය විමසන විට අවශ්‍යයෙන් ම සැලකිල්ලට ගත යුත්තකි.

පැරණි සාහිත්‍ය ග්‍රන්ථ හඬ වස්තූන් ලෙස සැලකීම අනවශ්‍ය යැයි ද ඒවායේ ඌනතා ඇතොත් එම ඌනතා ද විමසිල්ලට ලක්කිරීම මැනවැයි ද මෙරට මෑත යුගයේ දී පළමුවෙන් ම හඬක් නැගුවේ **මුනිදාස කුමාරතුංගයන්** විසිනි. මේ සම්බන්ධයෙන් ඔහු තම **විරිත් වැකිය** නම් ග්‍රන්ථයෙන් පළ කරන අදහස් ඉතා වැදගත් ය. ඇතැම් කරුණු අනුව සලකා බලන කල ශ්‍රී රාහුල මා හිමියන්ට දිය යුත්තේ කිවි නොව කුකවි නාමය යැයි යන ඔහුගේ ප්‍රකාශය නිසා ඇතිවූ **කුකවි වාදය** ද සිංහල විචාර කලාවේ ඉතිහාසය සම්බන්ධයෙන් වැදගත් ය.

නවකථාකරණය ගැන පමණක් නොව නවකථා ආස්වාදනය ගැන ද බොහෝ කරුණු ඉදිරිපත් කරමින් 1942 දී නූතන සිංහල ප්‍රබන්ධ කතා යන නමින් ඉංග්‍රීසියෙන් ග්‍රන්ථයක් පළ කළ **මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර** ඇතැම් ප්‍රකට ලේඛකයන්ගේ නැඟීමට මෙන්ම වැටීමට ද මුල් වූ විචාරකයෙකි. නැගුණේ මාර්ටින් වික්‍රමසිංහ යි. වැටුණේ ඩබ්ලිව්. ඒ. සිල්වා යි.



1949 දී සරච්චන්ද්‍ර විසින් පළ කරන ලද සාහිත්‍ය විද්‍යාව, විශේෂයෙන් කාව්‍යකරණය පිළිබඳවත් පැරණි ආලංකාරිකයන්ගේ විචාර මත ආදිය පිළිබඳවත් අවබෝධ කර ගන්නට ප්‍රයෝජනවත් ය. සාහිත්‍යයේ නොයෙක් අංශ පිළිබඳව ගැඹුරින් සිතා බැලීමට රසික පිරිස පොලඹවන කෘතියක් ලෙසින් ඔහුගේ "කල්පනා ලෝකය" හැඳින්වීමට පුළුවන.

මාර්ටින් වික්‍රමසිංහගේ "සිංහල සාහිත්‍යයේ නැඟීම" ද සිංහල සාහිත්‍ය විචාරයේ ඉතිහාසය විමසීමේදී අවශ්‍යයෙන් ම සඳහන් වියයුතු ග්‍රන්ථයක් වෙයි. චිරන්තන සාහිත්‍ය ග්‍රන්ථ දෙස නව දෘෂ්ටියකින් බැලිය යුත්තේ කෙසේ ද යන්න පිළිබඳව මේ ග්‍රන්ථයෙන් ලැබෙන්නේ මනා අවබෝධයකි.

වික්‍රමසිංහ විසින් "නව පද්‍ය සිංහලය" යන නමින් පළ කළ විචාර ග්‍රන්ථය වර්තමාන සිංහල කාව්‍යය සම්බන්ධයෙන් බලාපොරොත්තු වූ තරමින් විශාල බලපෑමක් කළ බවක් කිව නොහැක. ඔහුගේ විචාර මත, විචාර ලිපි, කාව්‍ය විචාරය, සාහිත්‍ය කලාව වැනි ග්‍රන්ථ ගැඹුරු පර්යේෂණාත්මක කෘති ලෙසින් හැඳින්විය නොහැකි වෙතත් විචාරාත්මක ලෙස කියවීමේ යෙදෙන්නේ කෙසේ ද යන කරුණු සම්බන්ධයෙන් සිංහල පාඨකයන්ට ඒවා ලබාදෙන්නේ මනා අවබෝධයකි.

වික්‍රමසිංහගේ "නවකථාංග හා විරාගය" නම් කෘතිය ඔහුගේ විරාගය නවකථාව සම්බන්ධයෙන් නැගුණු චෝදනාවලින් එය නිදොස් කර ගැනීමට ගන්නා ලද වෑයමක් පමණක් නොවේ. බෞද්ධ දර්ශනය, චිත්‍ර හා ප්‍රතිමා කලාව, ජාතක කථා, ආදී විෂයයන් කිහිපයක් පිළිබඳ ව වූ ලිපි කිහිපයක් ද එහි දක්නා ලැබේ. මෙම කෘතියෙහි උප ග්‍රන්ථයක් සේ එන පේරාදෙණිය සාහිත්‍යය හා සිංහල සංස්කෘතිය නම් ලිපිය එක් සාහිත්‍ය කල්ලියක දෙදරුම් කෑමක් විදහා දක්වයි. සරච්චන්ද්‍ර මේ ලිපිය හැඳින්වූයේ "කළ හොඳ පස්සෙන් පැන්නීමක්" පිළිබිඹු කරන්නක් ලෙසිනි. "සිංහල නවකථා ඉතිහාසය හා විචාරය" නම් කෘතියෙන් වික්‍රමසිංහට ලබාදෙන ලද මහත් වූ "තල්ලුව" පිළිබඳ ව මඳ හෝ තැකීමක් නොකොට වික්‍රමසිංහ විසින් මේ ලිපිය ලියා ඇති අන්දම ගැන සලකා බලන විට සරච්චන්ද්‍ර අර විදිහේ නිගමනයකට පත්වීමට පෙලඹීම පුදුමයට කරුණක් නොවේ.

මාර්ටින් වික්‍රමසිංහගේ සියලු විචාර ග්‍රන්ථ සමස්තයක් ලෙස ගෙන බලන විට පෙනී යන්නේ ඔහු එක්තරා ප්‍රමාණයකට පැරණි සංස්කෘත විචාර මූලධර්ම මෙන්ම බටහිර විචාර ක්‍රමද ඇසුරු කරමින් තම විචාර මත පළ කරන බවයි. අපේ සාහිත්‍ය කෘති විචාරයට ලක් කරන විට සිත තබාගත යුතු කරුණු කිහිපයක් ඔහු තම "විචාර මග" නම් ග්‍රන්ථයෙන් මතක් කර දෙයි. එහෙත් අපට සරිලන විචාර මඟක් යෝජනා කරන්නට ඔහු සමත් වී ඇති බවත් කිව නොහැකි ය.

ජී.බී. සේනානායකගේ "නවකථා කලාව", "සාහිත්‍ය සේසත්", "සාහිත්‍ය විග්‍රහය" හා "සාහිත්‍ය ධර්මතාව" වැනි ග්‍රන්ථ පිටු ගණනින් කුඩා වුවද සිංහල පාඨක පිරිසට ඒවායින් ලැබුණු විචාර අවබෝධය නම් සැලකිය යුතු තරම් මහත් ය. ගැඹුරු විචාර සිද්ධාන්ත හරඹ කිරීමකින් තොරව සාමාන්‍ය බුද්ධිය හා දැනුම පමණක් උපයෝගී කරගෙන ජී.බී. සේනානායක විසින් මෙම ග්‍රන්ථ සම්පාදනය කොට ඇත්තේ පොදු පාඨකයාට බෙහෙවින් ම සරිලන අයුරින් යැයි කිව හැකිය.

ජී.බී. සේනානායක විසින් ඇතැම් විට තම විචාර ග්‍රන්ථවලට දී ඇත්තේ ඒවායෙහි අන්තර්ගත වන කරුණුවලට සරිලන නාමයන් නොවන බව කියන්නට සිදුවේ. නවකථා කලාව ගැන සාකච්ඡා නොකරන ග්‍රන්ථයකට "නවකථා කලාව" යන නම දී තිබීම එක් නිදසුනකි. "සාහිත්‍යය විග්‍රහය" නම් ග්‍රන්ථය ඔහු විසින් ම දර්ශනාත්මක ගවේෂණයක් ලෙසින් හඳුන්වා දී ඇතත් ඉන් සිදුවන්නේ "සාහිත්‍යයෙහි නම්‍යතාව", "කථා පරිසරය", "සාහිත්‍ය අංග", "සාහිත්‍ය වර්ග" යනාදී වශයෙන් නම් කෙරෙන මාතෘකා කිහිපයක් සාකච්ඡාවට ලක්කිරීම පමණි. ඒ හැරෙන්නට කෙරෙන ගවේෂණයක්වත් විමසෙන දර්ශනයක්වත් එහි නැත. මොහුගේ "විචාර ප්‍රවේශය" නම් කෘතියෙන් සිදුවන්නේ අව්‍යාජත්වය හා ප්‍රතිභාව, ජන කාව්‍යය, විචාරය අද සරල මාතෘකා කිහිපයක් යටතේ විශේෂයෙන් ජනකවි ආර පිළිබඳ විමසීමකි.

මීටත් පසු කාලයේ විචාර කලාවේ ව්‍යාප්තිය පිළිබඳව සලකා බලන විට කාගේ වුවද සිතට පිවිසිය යුත්තේ කේ. ජයතිලක හා මහාචාර්ය ඒ.වී සුරවීර විසින් ඒ සම්බන්ධයෙන් සිදුකොට ඇති මෙහෙයයි. නිර්මාණකරණයේ දී තමා විසින් ලබන ලද අත්දැකීම් ගැන ද සඳහන් කරමින් කේ. ජයතිලක විසින් පළකොට ඇති "නූතන සිංහල නවකතාවට සංස්කෘතික හා දාර්ශනික පසුබිම", "සාහිත්‍ය විචාර සටහන්", "සාහිත්‍ය නිර්මාණයේ මුල්පොත", "සිංහල කතා කලාවේ විකාශනය", "සාහිත්‍ය විචාර චින්තාවලී" වැනි ග්‍රන්ථ සාහිත්‍ය විවේචනය පිළිබඳව මෙන්ම රසාස්වාදනය පිළිබඳව ද සිංහල පාඨකයන්ට ලබාදෙන්නේ මනා අවබෝධයකි. මේ කෘතිවල දී සාහිත්‍ය විචාරයේ මූලධර්ම, විචාරයේ ප්‍රභේද, නවකථාව හා සංස්කෘතික සංඝටනය වැනි මාතෘකා සාකච්ඡා කෙරේ. විටින් විට ඉංග්‍රීසි, රුසියානු, ප්‍රංශ ලේඛකයන්ගේ කෘතීත්, ඔවුන්ගේ මතවාදත් ඔහුගේ සැලකිල්ලට හසුවේ. බොහෝ විට මෙම කරුණු ඉදිරිපත් කෙරෙන්නේ සැලැස්මකින් තොරව බැව් පෙනේ. එහෙයින් පුනරුක්තියෙන් යුතුව එකම මාතෘකාව (බොහෝවිට එකම විදිහේ වචනවලින් ම) සාකච්ඡා කොට ඇති තැන් සුලභ ලෙස ජයතිලකගේ විචාර ග්‍රන්ථවල දී අපට හමුවේ. කෙසේ වුවද බොහෝ සාහිත්‍ය මතවාද, සංකල්ප හා සිද්ධාන්ත පොදු පාඨකයන්ගේ සිත් ඇදගන්නා අයුරින් පැහැදිලි ලෙස හා සරල ලෙස ඉදිරිපත් කිරීම අතින් ජයතිලකට ලැබෙන්නේ ඉහළ තැනකි.



මහාචාර්ය ඒ.වී. සුරවීර විසින් විචාර කලාව සම්බන්ධයෙන් ඉටුකරන ලද විශාලතම මෙහෙය ලෙසින් සැලකිය හැක්කේ විචාර ක්ෂේත්‍රයෙහි යොදාගනු ලබන නොයෙක් සංකල්ප හා ඊට සම්බන්ධ පාරිභාෂික වචන පිළිබඳ ව සිංහල පාඨකයාට මනා දැනුමක් ලබා දෙන අදහසින් "විචාර ප්‍රදීපිකා" යන නමින් ග්‍රන්ථයක් සම්පාදනය කිරීමයි. විචාර කාර්යයේ දී භාවිතයට ගත හැකි මනා වචන කෝෂයක් නැතිවීමේ අඩුව මින් බොහෝදුරට මඟහැරී යන බැව් කිව හැකියි.

ඇරිස්ටෝටල්ගේ "කාව්‍ය ශාස්ත්‍රය", ටෝල්ස්ටෝයිගේ "කලාව යනු කුමක් ද" යන ග්‍රන්ථ සිංහලට පරිවර්තනය කිරීම ද විචාර ක්ෂේත්‍රය සම්බන්ධයෙන් මහාචාර්ය සුරවීරගෙන් සිදුවී ඇති තවත් මෙහෙයකි. විචාර විලාසය, සිංහල සාහිත්‍ය සම්ප්‍රදාය, නවකථා නිර්මාණය හා අවබෝධය "සමාජීය සාහිත්‍ය අධ්‍යයනය" වැනි ග්‍රන්ථවලින් සාහිත්‍ය විචාරය හා රසාස්වාදය සම්බන්ධයෙන් සිංහල පාඨකයනට ලබා දෙන දැනුම විශාල ය. ජේම්ස් ජොයිස්, ටී. එස්. එලියට්, ජෝර්ජ් ලූකාස්, රේමන්ඩ් විලියම්ස් යන ලේඛකයන්ගේ සාහිත්‍ය විචාරය පිළිබඳ ලිපි හතරක් "සම්ප්‍රදාය, නිර්මාණය සහ විචාරය" යන ග්‍රන්ථයෙන් ඉදිරිපත් කිරීමෙන් ද මහාචාර්ය සුරවීර විසින් සිදුකොට ඇත්තේ පැසසිය යුතු කාර්යයකි.

ඉහත සඳහන් කරන ලද සියලුම ලේඛකයන් විචාර කලාව සම්බන්ධයෙන් ද මහඟු මෙහෙයක් සිදුකොට ඇත්තේ නිර්මාණ කාර්යයෙහි යෙදෙමින් ය. වෙනත් බොහෝ රටවල මෙන් මෙහිද තම සම්පූර්ණ කාලය විචාර කලාව සඳහාම මිඩංගු කරන වියතුන් පිරිසකගේ අවශ්‍යතාව පසුගිය කාලයෙහි තදින් දැනුණි. මේ අවශ්‍යතාව දැන් සම්පූර්ණ වන්නට පටන්ගෙන ඇති ලෙසත් ප්‍රකට වන්නේ පසුගිය දශක එක හමාරක පමණ කාලයක් තිස්සේ නව පරපුරේ වියතුන් විසින් විචාර ක්ෂේත්‍රයෙහි ඉටුකර ඇති මෙහෙය කෙරෙහි සිත් යොමු කරන විටය. මේ නව පරපුරේ විචාරක පිරිසෙහි මුල් තැනෙහි තැබිය හැක්කේ මහාචාර්ය කුලතිලක කුමාරසිංහ යැයි කෙරෙන නිගමනයට කාගේත් ඒකඟත්වය ලැබේ යැයි හැඟේ.

මහාචාර්ය කුලතිලක කුමාරසිංහගේ මුල්ම විචාර ග්‍රන්ථය වන "සිංහල කෙටි කතාවේ වර්ධනීය අවස්ථාවක්" නම් කෘතිය ප්‍රකාශයට පත්වූයේ 1985 වර්ෂයේ දීයි. ඊට පෙරද ඔහු විසින් ග්‍රන්ථ සංස්කරණය, නාට්‍ය කලාව, කවිය, පරිවර්තනය ආදී ක්ෂේත්‍රවලට අයත් ග්‍රන්ථ ගණනාවක් රචනා කොට තිබුණි. ජපන් භාෂාව පිළිබඳව ද වියතෙකු වන ඔහු විසින් නෝ නාට්‍යයේ රංග ශෛලිය, නෝ කබුකි නාට්‍ය කලාව වැනි ග්‍රන්ථ ද ඒ මුල් යුගයේ දී රචනා කොට තිබූ බව සඳහන් කළ යුතුව පවතී.

මහාචාර්ය කුලතිලක කුමාරසිංහ 1985 වර්ෂයේ සිට තම ප්‍රධාන විෂය ක්ෂේත්‍රය කෙටිකථා හා නවකථා විචාරය බවට පත්කර ගන්නට

අදහස් කරන ලද බව පෙනේ. විශේෂයෙන් කෙටිකථා අංශය පිළිබඳ ව අද මෙරට සිටින විශිෂ්ටතම විචාරකයා ඔහු බවට කවර හෝ සැකයක් නැත. ඒ විෂයට අයත් ඔහුගේ ග්‍රන්ථ සමූහයෙන් මෙන් ම ලිපි ලේඛන රාශියෙන් මේ බව මැනවින් ප්‍රකට වෙයි.

මේවන විට මහාචාර්ය කුලතිලක කුමාරසිංහ විසින් කෙටිකථා ක්ෂේත්‍රය අළලා රචිත ග්‍රන්ථ ගණන විස්සට අධික ය. මේ අතරින් ඔහුගේ ඉතා වැදගත් ග්‍රන්ථයක් සේ හැඳින්විය යුත්තේ කෙටිකථා විචාර මූලධර්ම හා සම්ප්‍රදාය නම් කෘතියයි. මෙහි මුලින් ම සාකච්ඡාවට ලක්වන්නේ කෙටිකථාව යනු කුමක් ද යන මාතෘකාවයි. මෙහිදී කෙටිකථාවේ ප්‍රභවය සාකච්ඡා කරන කතෘ එඩ්ගා ඇලන්පෝ නැතැනියල් හෝතෝන්, ගී ද මෝපසාං, ඇන්ටන් චෙකෝෆ් ආදීන්ගේ ඇසුරේ වර්තමාන කෙටිකථාව වැඩුණු සැටි විමසිල්ලට ලක් කෙරේ. කෙටිකථාවේ ස්වභාවය පිළිබඳව විදේශීය මෙන් ම දේශීය වියතුන් විසින් කරුණු දක්වා ඇති අන්දම මැනවින් විභාග කොට ඒ අදහස පසුව සම්පිණ්ඩනය කොට දක්වා ඇත්තේ මේ විෂය පිළිබඳ වැඩි දැනුමක් නැති ආධුනිකයන්ට මෙන්ම ඒ පිළිබඳ තම දැනුම වැඩි දියුණු කර ගන්නට කැමැත්තෙන් සිටින වියතුන්ට ද ප්‍රයෝජනවත් වන අයුරිනි.

ජේ. බුචාන්, අර්නස්ට් ඒ. බේකර්, ඉයන් වොට්, ෆ්‍රෙඩ්රික් පර්කින්ස් වැනි ප්‍රකට විචාරකයන් විසින් කෙටිකථාවත් නවකථාවත් අතර පෙනෙන වෙනස සාකච්ඡා කරන අයුරු කුලතිලක කුමාරසිංහ සූරීන් මෙහිදී විභාග කොට ඇත්තේ තමන්ගෙන් ද එයට බොහෝ කරුණු එක් කරමිනි.

කෙටිකථාව මෙසේ වියයුතු යැයි කිසිවෙකුටත් නීතියක් පැනවිය නොහැකි බව අමුතුවෙන් කිවයුත්තක් නොවේ. එහෙත් ඒ පිළිබඳ විචාරකයන්ගේ අදහස් එකිනෙක හා සසඳා බලා එහි ස්වභාවය සම්බන්ධයෙන් ඔවුන්ගේ යම් එකඟත්වයක් ඇත්නම් ඒ කුමන කරුණු සම්බන්ධයෙන් දැයි තීරණය කොට දැක්වීම අපහසු කාර්යයක් නොවේ. කතා ප්‍රවෘත්තිය, කතා වින්‍යාසය, චරිත නිරූපණය, පරිසර වර්ණනා, යථාර්ථ නිරූපණය, සංකේත නිරූපණය, භාෂා ලක්ෂණ යනාදී අංග ඉහත සඳහන් කරන ලද ග්‍රන්ථයෙන් විමසිල්ලට ලක්වන සෙසු අංග අතර වෙයි. ග්‍රන්ථය අවසාන වන්නේ අමෙරිකානු, ප්‍රංශ හා රුසියානු කෙටිකථා සම්ප්‍රදායන් පිළිබඳ හැඳින්වීමකිනි.

ප්‍රකට තත්ත්වයකට පත්වී සිටින එක් එක් සිංහල කෙටිකථාකරුවා පිළිබඳ ව වෙනම ග්‍රන්ථය බැගින් රචනා කිරීම ඇතැමුනට පෙනිය හැක්කේ ක්‍රියාත්මක කළ නොහැකි යෝධ කර්තව්‍යයක් ලෙසිනි. එහෙත් ඒ දුෂ්කර කාර්යය ඉටුකර ඇති සැටි ඩබ්ලිව්. ඒ. සිල්වා, මාර්ටින් වික්‍රමසිංහ, හේමපාල මුනිදාස, ටී.ජී. ඩබ්ලිව් ද සිල්වා, ජී.බී. සේනානායක, කේ. ජයතිලක, ගුණදාස අමරසේකර, මිණිවන් පී. තිලකරත්න, ඇරැව්වල නන්දිමිත්‍ර යන කෙටිකථාකරුවන්ගේ කෘති



විමර්ශනයට ලක්කරමින් මහාචාර්ය කුමාරසිංහ විසින් දැනටමත් විචාර ග්‍රන්ථ ප්‍රකාශයට පත්කොට ඇති හෙයිනි. මේ දක්වාම ඉහත සඳහන් කරන ලද ලේඛකයන්ගේ වුවද ඇතැම් වැදගත් කෙටිකථාද අවශ්‍ය පමණින් සාකච්ඡාවට භාජන වී ඇතැයි කිව නොහේ. ඉතා දිගු කාලයක් සිංහල සාහිත්‍ය ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක වී සිටි ජී.බී. සේනානායකගේ කෙටිකථා, සංග්‍රහ අතරින් පවා ප්‍රමාණවත් ලෙසින් විමසිල්ලට ලක්වී ඇත්තේ දුප්පතුන් නැති ලෝකය හා පළිගැනීම යන කෘති දෙක පමණි. ඒ දෙකට වුවද එවැනි විචාරක අනුග්‍රහයක් ලැබුණේ ඉන් එකක්, එනම් දුප්පතුන් නැති ලෝකය, කලක් විභාගවලට නියමිත පාඨ ග්‍රන්ථයක් ලෙස භාවිතයට ගැනුණු හෙයිනි. මේ නිසා දුප්පතුන් නැති ලෝකය සමග පළිගැනීම සැසඳීමට ලක්කිරීම බොහෝවිට අවශ්‍ය විණි. එහෙයින් එක්තරා සැලකිල්ලක් පළිගැනීමට ලැබුණි. එහෙත් ජී.බී. සේනානායක විසින් ඉන් පසුව ලියන ලද මිතුරිය, ගමන, නැටුම වැනි කෙටිකථා, සංග්‍රහ පිළිබඳව බොහෝදෙනාගේ අවධාරණය යොමු නොවුණි. ඒ අඩුව සම්පූර්ණ වූයේ මහාචාර්ය කුලතිලක කුමාරසිංහ විසින් ජී.බී. සේනානායක කෙටිකතා විමර්ශන නම් කෘතියෙන් බව කිව යුතු ය.

සිංහල ලේඛකයන් අතර බටහිර කෙටිකථා සම්ප්‍රදායෙන්, විශේෂයෙන් රුසියානු කෙටිකථා සම්ප්‍රදායෙන් විශාල ලෙසින් අභාසය ලත් පළමු කෙටිකථාකරුවා ජී.බී. සේනානායක යැයි කිව හැකිය. ඔහු එසේ බටහිරින් ලැබූ ආභාසය පමණක් නොව ජාතක කථා ආදියෙන් ද ලැබූ ආභාසය කුලතිලක කුමාරසිංහ සූරීන් සිය ග්‍රන්ථයෙන් ගැඹුරින් නිරීක්ෂණයට ලක් කරයි. ඇතැම් විචාරකයෝ ජී.බී. සේනානායකගේ කෙටිකථාවල දක්නට ලැබෙන දුර්වලතා විමසීමට උත්සුක නොවෙති. එහෙත් මෙම ග්‍රන්ථයේ අවසාන වශයෙන් එන පස්වන පරිච්ඡේදයෙන් සිදුවන්නේ ඒ කාර්යය ඉටුකිරීම යි.

මෙරට කියවන සමාජය ව්‍යාප්තවීම සම්බන්ධයෙන් ඩබ්ලිව්. ඒ. සිල්වාගේ නිර්මාණවලින් ඉටුවූයේ විශාල මෙහෙයකි. ඔහුගේ නවකථා අගයෙන් ඉතා ඉහළ මට්ටමකට පිවිසීම ඔහුගේ කෙටිකථා ගැන අවශ්‍ය තරම් පාඨක හා විචාර අවධාරණය නොලැබී යෑමට එක් හේතුවක් වූ සැටි පෙනේ. අනිත් අතට ඩබ්ලිව්. ඒ. සිල්වා ද කෙටිකථාව, නවකථාව තරම් ම වැදගත් වූ සාහිත්‍යාංගයක් ලෙස සැලකූ බවක් නොපෙනේ. ඔහු ලියූ බොහෝ කෙටිකථාවලින් මේ කරුණු ප්‍රකට වෙයි.

කෙටිකථාව හා නවකථාව අතර ඇති ප්‍රධාන වෙනස ලෙසින් සිල්වා විසින් සැලකිල්ලට ගෙන ඇත්තේ ඒවායෙහි පිටු ගණන අතින් ඇති දීර්ඝත්වයයි. නවකථාව දිගය. කෙටිකථාව කෙටි ය. යනු ඔහු මේ සම්බන්ධයෙන් බැසගෙන සිටි තීරණය සේ පෙනේ. එහෙත් ඔහුගේ කෙටිකථා දෙස බලන විට පෙනී යන්නේ ඒ සම්මතය ගැන වුවද ඔහු ඒ තරම් තැකීමක් නොකළ බවයි. දෙයියන්ගේ රටේ වැනි වූ පිටු එකසිය හැට ගණනකින් යුත් කුඩා නවකථාවක ස්වරූපය ගත් කෙටිකථා ලියා

ඇති සැටියෙන් මේ බව පෙනේ. මෙහි දී අප සිතට ගත යුතු කරුණක් වන්නේ විශිෂ්ට ගණයේ ඇතැම් ලේඛකයන් සාහිත්‍යකරණයෙහි යෙදීමේ දී පවතින සම්මතය පිළිබඳ ව ඒ තරම් ම තැකීමක් නො කරන්නට ඉඩ ඇති බවයි. තමන් ලියන්නේ කවර ආකාරයේ සමාජයකට ද යන්න සැලකිල්ලට ගෙන ඒ අනුව ඔවුහු ලියති. ඔවුන්ගේ කෘති විචාරයට ලක් කරද්දී අප විසින් ඒ කරුණ ද අවශ්‍යයෙන් ම සැලකිල්ලට ගත යුතු ය. මහාචාර්ය කුලතිලක කුමාරසිංහ විසින් ඩබ්ලිව්. ඒ. සිල්වාගේ කෙටිකථා පිළිබඳ විචාරයක යෙදෙන්නේ සිදුවිය යුතු අන්දමින් ඉහත සඳහන් කරන ලද කරුණ ද සිතින් දරා ගනිමිනි. ඒ බව ඔහු කරන මේ සඳහනින් මැනවින් ප්‍රකට වෙයි. "'.........සිල්වාගේ කෙටිකථා විවේචනය කිරීමේ දී නූතන විචාර මූලධර්මවල එල්බ ගැනීම නොමඟ යාමක් වන්නේය. ඔහුගේ කථා පිළිබඳ කරනු ලබන විමර්ශනයක දී අප මතක තබා ගත යුතු වැදගත් කරුණක් නම්, ඔහු විසින් ලියනු ලැබුවේ බණ කතාවට මනස යොමු වී සිටි ජනතාවකට බවයි." ලේඛකයා ලිවිය යුත්තේ කාලීන අවශ්‍යතා ද සැලකිල්ලට ගනිමිනැ යි යන ඉතා වැදගත් කරුණ මහාචාර්ය කුමාරසිංහ විසින් මැනවින් සිතට ගෙන ඇති සැටි මේ ප්‍රකාශයෙන් පෙනේ. සරච්චන්ද්‍ර සිංහල නවකථාව පිළිබඳ තම විචාර ග්‍රන්ථය සකස් කරද්දී මේ කරුණු ඔහුගේ අවධාරණයට යොමු නොවුණි. පියදාස සිරිසේන, ඩබ්ලිව්. ඒ. සිල්වා වැනි ලේඛකයන්ට ඔහුගේ එම ග්‍රන්ථයෙන් තදබල අසාධාරණයක් සිදුවූයේ එහෙයිනි.

කිසියම් ලේඛකයකුගේ කාර්යය සාර්ථක වී ඇද්ද යන්න පිළිබඳව විමසීමක යෙදෙන අතර ඔහුගේ පරමාර්ථය කුමක් වීද යන්න ගැන ද අප සෝදිසියෙන් සිටිය යුතු ය. තමා කෙටිකථා ලියන්නේ විවේකය විනෝදයෙන් ගත කරනු කැමතියනගේ ප්‍රයෝජනය සඳහා බව ඩබ්ලිව්. ඒ සිල්වා විසින් බොහෝ තන්හි දී සඳහන් කොට තිබුණකි. 'අමෘත හස්තය සහ තවත් කථා' නම් කෘතියේ සංඥාපනයෙන් ඔහු මේ කරුණ විශේෂයෙන් අවධාරණයට ලක්කරයි. "විශ්‍රාමය මහඟු පළඳනාවකි. එහෙත් එය නිතර පැළඳිය යුතු නොවෙයි. ගත සිත වෙහෙසමින් වැඩ කටයුතුවල යෙදෙන උදවියට පමණක් විශ්‍රාමය හිමියි. වැඩ කෙළවර වන තැන අවකාශය, විශ්‍රාමය, නම් වන හෙයින් ඒ කම්මැලියා සතු නොවන්නකි. විශ්‍රාමය විනෝදයෙන් ගත කළ යුතු ය. විශ්‍රාමය ලද තරම් පහසුවෙන් විනෝදය නොලද හැකියි. සමහරුන් එය වෙනුවෙන් ලොකු මුදලක් වියදම් කරන නමුත් මෙසේ සුළු මුදලකින් එවැන්නක් කාහටවත් සිත් සේ ලබන්නට මං පාදාදීම ඉතා වැඩදායක බව කුමට කියම්ද?" (පි.1) ඩබ්ලිව්. ඒ. සිල්වා මෙහි "විශ්‍රාමය" යනුවෙන් හඳුන්වන්නේ මහන්සියෙන් වැඩෙහි යෙදෙන තැනැත්තා වෙත ඒ අවසානයෙහි ළඟාවන විවේකය යි. තමා නොයෙක් කථා ලියන්නේ එසේ විවේකය විනෝදයෙන් ගතකිරීමට මඟක් සපයා දීමට ය යන කරුණු ඉහත



සඳහන් කරන ලද ප්‍රකාශයෙන් සිල්වා ඉඳුරා පළ කරයි. එසේ නම් ගැඹුරු නිර්මාණ නොකළය යි යන චෝදනාව ඔහු වෙත එල්ල කිරීමෙන් පලක් නැත. මේ කරුණ මහාචාර්ය කුලතිලක කුමාරසිංහ විසින් මැනවින් වටහාගෙන තිබූ සැටි ඔහු සිල්වාගේ කෙටිකථා විචාරයට හසුකරන ආකාරයෙන් පෙනේ. ඩබ්ලිව්. ඒ. සිල්වාගේ නිර්මාණවල ඇති "දුර්වලතා" ඒවාට ඇතුළු වී ඇත්තේ ඔහු විසින් දරන ලද කවර මති මතාන්තර නිසා ද යන්න සොයා බැලීම විචාරකයන් සතු කාර්යයකි. සරච්චන්ද්‍ර අතින් හෝ වෙනත් කිසිවෙකුගෙන් හෝ ඒ කාර්යය මෙතෙක් සිදු වී ඇති බවක් කිව නොහැක. මහාචාර්ය කුමාරසිංහ තම කෘතියෙන් ඩබ්ලිව්. ඒ. සිල්වා විසින් නිර්මාණ කාර්යයේ දී හිසින් දරාගෙන සිටි දුර්මත සානුකම්පික ලෙස හෙළිකරන සැටි ප්‍රශංසනීය යි. ඔහු මෙය සිදුකරන්නේ සිල්වා විසින් ම තම කෙටිකථා සංග්‍රහවලට ලියන ලද සංඥාපන ආදියෙන් කොටස් උපුටා දැක්වීමෙනි. ඩබ්ලිව්. ඒ. සිල්වාගේ අදහස වන්නේ ජීවිතය ඇසුරින් කරන ලද නිර්මාණයකට වඩා ලේඛකයන්ගේ "කල්පනා ශක්තියෙන් ම සැහැදුණු" කල්පිතය ඉතා උසස් ය යනුයි. සිල්වාගේ අමෘත හස්තය සහ තවත් කථා නම් කෙටිකථා සංග්‍රහයේ එන සංඥාපනයෙන් කොටසක් උපුටා දක්වා මහාචාර්ය කුමාරසිංහ සිල්වාගේ නිර්මාණ කලාත්මක බවක් නොගෙන කෘත්‍රිම බවක් ගෙන තිබීමට යටින් ඇති රහස හෙළිදරව් කරයි. "ස්වභාවයෙන් නොමැවුණු එහෙත් කල්පනා ශක්තියෙන් සැදුණු හැම දෙයක් ම හැම කර්මාන්තයක් ම හැම කලාකාරියක් ම යමක් බලාගෙන කැරෙන අනුකෘතියකට වඩා උසස් බව කිව යුතු ය. යමක් දෙස බලාගෙන කැරෙන අනුකෘතිය නොහොත් විස්තරය කවරකුට වුවද කළ හැකියි. එහෙත් අමුතුවෙන් යමක් පහළ කිරීම හැමට ම කළ නොහැකි යි. එහෙයින් කල්පිතය, ප්‍රතිරූපයට වඩා ඉතා උසස් බව නිසැකයෙන් දත යුතුයි." (පි.111) මෙවැනි මතයක් හිසින් ගත් ඩබ්ලිව්. ඒ. සිල්වා අතින් තාත්වික, ජීවිතය පිළිබඳ මනා විවරණයක් සපයන කෙටිකථා ආදිය බිහිනොවීම ගැන අප පුදුමයට පත්විය යුතු නැත.

ඩබ්ලිව්. ඒ. සිල්වාගේ කෙටිකථාවල පෙනෙන සියලු අඩුපාඩුවලට හේතු වී ඇත්තේ ඔහු විසින් කලක් තිස්සේ සිතින් ගෙන තිබූ දුර්මත රාශියක් නිසා බව මහාචාර්ය කුලතිලක කුමාරසිංහ සිය ග්‍රන්ථයෙන් පෙන්වා දෙන්නේ සානුකම්පික ලෙසින් මිස නිර්දය ලෙස කරනු ලබන විවේචනයෙන් නොවේ.

මතකයෙන් ගිලිහීගෙන යන හේමපාල මුනිදාස වැනි ලේඛකයන් ගැන මඳ හෝ උනන්දුවක් නැති අද වැනි කලෙක ඔහුගේ කෙටිකථා විමසිල්ලට ලක් කරමින් පොතක් පළ කිරීම කෙනෙකුගේ විමතියට පවා හේතුවිය හැකි කරුණකි. ඉහළ මට්ටමකට පත් වී ඇති වර්තමාන මෙන් ම පැරණි පෙළේ කෙටිකථාකරුවන්ගේ කෘති ද සාකච්ඡා කිරීම අවශ්‍යයෙන් ම කළ යුත්තක් බව සිතන මහාචාර්ය කුලතිලක කුමාරසිංහ

හේමපාල මුනිදාසගේ කෙටිකථා කෙරෙහි ද තම විචාර ඇස යොමුකරන්නේ මහත් වූ උනන්දුවකින්ම යි.

මනාලිය, වහල් වෙන්දේසිය, නාරි ගැටය, කිණ්ණර පිස්සුව, රතු කැට, සැකය ආදී හේමපාල මුනිදාසගේ කෙටිකථා සංග්‍රහ පිළිබඳ ව තම ග්‍රන්ථයේ පළමුවෙනි පරිච්ඡේදයෙන් පොදුවේ හැඳින්වීමක් ඉදිරිපත් කරන කුමාරසිංහ සූරීන් අනතුරුව දෙවන පරිච්ඡේදයෙන් ඒ ලේඛකයා බැහැරින් යම් ආභාසයක් ලබා ඇත්නම් ඒ කරුණු විමසිල්ලට ලක් කරයි.

හේමපාල මුනිදාස විසින් තම කෙටිකථා, රචනා කිරීමේදී සියුම් ලෙස චරිත නිරූපණය කිරීමටත් වඩා වැඩි වෙහෙසක් ගෙන ඇත්තේ ඒවායෙහි එන සිදුවීම් පෙළ මැනවින් සකස් කොට පෙළ ගස්වා ඉදිරිපත් කිරීමට බව මේ විචාරකයා දකියි. මේ වූ කලී ප්‍රංශ කෙටිකථා කරුවකු වන ගීද මෝපසාංගේ කථාවලින් ද ප්‍රදර්ශනය වන ප්‍රධාන ලක්‍ෂණයකි. මේ අනුව රතු මැණික, සියුම් පළිගැනීමක්, මහ රෑ ආ මාරයා, උපාසිකාව, පාපයේ පොලිය වැනි කථාවල මඳ වශයෙන් මෝපසාංගේ කථා කලාවේ ලකුණු දක්නට හැකි සැටි මහාචාර්ය කුමාරසිංහ පෙන්වා දෙයි.

රුසියානු ලේඛක ටෝල්ස්ටෝයි ගෙන් ලත් ආභාසය පළ කරන කෙටිකථා වශයෙන් මෙම කෘතියෙන් නම් කොට ඇත්තේ හිරකාරයා, පිටුවහල් කිරීම වැනි කෙටිකථා යි. මනා ලෙස සාක්‍ෂි ඉදිරිපත් කරමින් මේ කරුණු විචාරකයා සාකච්ඡාවට ලක් කරයි.

හේමපාල මුනිදාස පැරණි ජාතක කථා ආදියෙන් ද ආභාසය ලැබීමට මැළි නොවූ සැටි වහල් වෙන්දේසිය, නම් කථා සංග්‍රහයේ එන වහල් වෙන්දේසිය, රතු කැට සංග්‍රහයේ එන වසූරිය වැනි කෙටිකථා විමසමින් පෙන්වා දී ඇත.

පැරණි පෙළේ සිංහල කෙටිකථාකරුවන් ලිංගික ජීවිතය හා සම්බන්ධ සිද්ධි ගෙන නිර්මාණකරණයෙහි යෙදීමට පෙලඹී සිටි බවක් නොපෙනේ. එහෙත් හේමපාල මුනිදාසගේ කිණ්ණර පිස්සුව, දතට දත වැනි කථාවලින් ප්‍රකට වන්නේ ඔහු මේ ක්ෂේත්‍රයට අත ගැසීමට නොමැලි වූ සැටියි. මේ කරුණු ඇතුළුව මේ ලේඛකයා තම කෙටිකථා රචනයේ දී වස්තු සපයා ගත් ආකාරය පිළිබඳව මහාචාර්ය කුමාරසිංහගේ පරීක්‍ෂණයට ලක්වන්නේ මෙම කෘතියේ තුන්වන පරිච්ඡේදයේ දීය. එය වස්තු විෂය ක්ෂේත්‍රය යනුවෙන් හැඳින්වේ. මෙහි එන සිව්වැනි පරිච්ඡේදයෙන් චරිත නිරූපණයෙහි ලා හේමපාල මුනිදාසගේ සමත්කම විමසෙන අතර පස්වන හා හයවෙනි පරිච්ඡේදවලින් ඔහුගේ ජීවන දෘෂ්ටිය, භාෂා රීතිය වැනි අංග විමසිල්ලට ලක්කෙරේ. මෙහි ඉදිරිපත් කෙරෙන කරුණුවලට නිදසුන් සපයන අදහසින් සපයා ඇති උපග්‍රන්ථයෙන් කෙටිකථා කිහිපයක් උපුටා දක්වා ඇත.

මාර්ටින් වික්‍රමසිංහගේ නිර්මාණාත්මක කෘති අතුරින් බොහෝ සෙයින් සාකච්ඡාවට ලක්වී ඇත්තේ නවකථායි. ඊට විශේෂයෙන් හේතු වී ඇත්තේ මාරුවෙන් මාරුවට ගම්පෙරළිය, යුගාන්තය, විරාගය ආදී නවකථා විභාගවලට නියම කොට තිබීමයි. ඔහුගේ කෙටිකථා ඊට අඩු



මට්ටමකින් වුවද සාකච්ඡාවට ලක්වූ නමුත් ඒවායෙහි පැහැදිලි ලෙස පෙනුණු දුබලතා වුවද විමසිල්ලට ලක්කිරීමට බොහෝ විචාරකයෝ පසුබට වූහ. සරච්චන්ද්‍ර වුවද තම සිංහල නවකථා ඉතිහාසය හා විචාරය නම් කෘතියෙහි වික්‍රමසිංහගේ කෙටිකථාවල අඩුපාඩු දැක්වීමට කැමැත්තක් නොදැක්වීම ප්‍රකට ලෙස පෙනෙන කරුණකි. එහෙත් මහාචාර්ය කුලතිලක කුමාරසිංහ සිංහල කෙටිකථාවේ කලාත්මක මුහුණුවර හා මාර්ටින් වික්‍රමසිංහ නම් කෘතියෙන් එක් පරිච්ඡේදයක් මිඩංගු කොට ඇත්තේ වික්‍රමසිංහගේ කෙටිකථාවල දක්නට ලැබෙන දුර්වලතා සාකච්ඡා කිරීමට යි.

මානව විද්‍යාව, සමාජ විද්‍යාව, ඉතිහාසය, සංස්කෘතිය ආදී විෂයන් පිළිබඳ ව ලේඛකයෙකුට අවශ්‍ය පමණට වික්‍රමසිංහ වෙත දැනුමක් තිබුණි. ඒ අතර ඔහු කලක සිට ම සිටියේ සමකාලීන ලේඛකයන්ට පමණක් නොව පාඨකයන්ට ද වඩා ඉදිරියෙනි. එහෙයින් ම තමාගේ විද්‍යාත්මක හා ශාස්ත්‍රීය දැනුමෙන් තම පාඨක පිරිසට ප්‍රයෝජනයක් ලබාදීමට වික්‍රමසිංහ වෙත උනන්දුවක් තිබුණි. එක් අතකින් එය අප පැසසිය යුතු අංගයක් ලෙස නම් කළ හැකි වුවත්, එය විචාරක පැසසුමට භාජන නොවන්නකි. මේ පිළිබඳ කරුණු මහාචාර්ය කුමාරසිංහ තම ග්‍රන්ථයේ අවසාන කොටසින් සාකච්ඡා කරයි.

මාර්ටින් වික්‍රමසිංහගේ කෙටිකථා සමස්තයක් ලෙස ගෙන විමසන කල පැහැදිලි ලෙස පෙනෙන එක් කරුණක් වන්නේ ඔහු මුලින් ම ලියූ ගැහැනියක් නම් සංග්‍රහයේ එන කථාත් අවසාන වශයෙන් ලියූ වහල්ලු නම් සංග්‍රහයේ එන කථාත් අතර අගය අතින් ඒ තරම්ම පරතරයක් නැතිවීම යි. එහෙත් ඔහුගේ ලීලා නවකථාවත් අවසාන වර්ෂ කිහිපය තුළ ලියූ විරාගය, බවතරණය ආදී නවකථාත් අතර බොහෝ කාරණා අතින් ඇත්තේ විශාල පරතරයකි. කුමාරසිංහ සූරීන් විසින් මෙම කරුණ මැනවින් හඳුනාගෙන ඇති සැටි වික්‍රමසිංහගේ කෙටිකථාවල කලාත්මක විකාශනය විමසීම සඳහා මිඩංගු කොට ඇති දෙවන පරිච්ඡේදයේ දී ඉදිරිපත් කෙරෙන කරුණුවලින් පෙනේ.

මාර්ටින් වික්‍රමසිංහගේ කෙටිකථාවල වස්තු විෂය ක්ෂේත්‍රය, චරිත නිරූපණය, ජීවන දර්ශනය ආදී අංග අළලා ලියා ඇති පරිච්ඡේදවලින් ද ඇතැම් විචාරකයන්ගේ ඇස නොගැසුණු තැන් රාශියක් පෙන්වා දී ඇති බැව් කිව හැකි ය. මේ කොටස්වල දී වික්‍රමසිංහගේ කෙටිකථා පිළිබඳ ව වෙනත් ලේඛකයන් විසින් පළකොට ඇති විවිධාකාර මත ගැන සඳහන් කොට ඒවායේ පිළිගත නොහැකි බවක් දක්නා ලැබේ නම් ඒ කවර තන්හි දී දැයි පෙන්වා දීමට කුමාරසිංහ සූරීන් දක්වන උනන්දුව ප්‍රශංසනීය යි. මේ කාර්‍ය්‍යයේ දී ඒ විචාරකයන්ගේ උස්මිටිකම් ගැන තැකීමක් කළ බවත් නොදක්නා ලැබේ. මේ කරුණට නිදසුනක් ලෙසින් මහාචාර්ය සරච්චන්ද්‍රගේ ප්‍රකාශයක් ගැන කර ඇති සඳහනකින් කොටසක් මෙහි උපුටා දක්වනු ලැබේ. "අපරදිග කෙටිකතා අතුරෙන්

වික්‍රමසිංහගේ කතා කෙරෙහි බෙහෙවින් බලපා ඇත්තේ ඇන්ටන් චෙකොෆ්ගේ කෙටිකතා යැයි මහාචාර්ය සරච්චන්ද්‍ර පවසන අදහස එකහෙළා පිළිගත නොහැකි ය. ඔහුගේ කෙටිකතා අතර ඇති අපූර්ව ප්‍රතිභාවකින් යුත් නිර්මාණවලින් ප්‍රකට වන්නේ ඔහුගේ පෞද්ගලිකත්වය පිළිබඳ "සලකුණ" මිස කිසියම් සම්ප්‍රදායක් අනුව යෑමක් නොවේ." (පි.53)

තමාගේ ඇතැම් කෙටිකථාවලට වස්තු වූ අත්දැකීම් වික්‍රමසිංහ විසින් ම තමාගේ නොයෙක් ග්‍රන්ථවල හා ලිපි ලේඛනවල පැහැදිලි කර ඇති බව ප්‍රකට කරුණකි. කිසියම් අත්දැකීමක් සාර්ථක කෙටිකථාවක් බවට පරිවර්තනය වන අන්දම ගැන දැනගැනීමට උනන්දුවන්නට මේ අත්දැකීම් කෙබඳු ඒවා දැයි දැනගැනීමට ඇත්තේ දැඩි කුතුහලයකි. මේ කුතුහලය සංසිඳුවමින් මහාචාර්ය කුමාරසිංහ විසින් ඇතැම් කෙටිකථා විමසන අතර ම ඒවාට මුල්වූ අත්දැකීම් ගැන වික්‍රමසිංහ විසින් කර ඇති විස්තර ගැන ද සඳහන් කිරීමට ද උනන්දුවක් දක්වා තිබීම පැසසුමට භාජනය විය යුත්තකි.

නූතන උපහාස කෙටිකථාකරුවෙකු ලෙසින් ප්‍රකට ටී. ජී. ඩබ්ලිව් ද සිල්වාගේ කෙටිකථා පිළිබඳ ව ද මහාචාර්ය කුමාරසිංහගේ ග්‍රන්ථයක් වෙයි. එය නම් කොට ඇත්තේ 'ටී.ජී. ඩබ්ලිව් ද සිල්වා සහ පුවත්පත් කෙටිකතා' යන නමිනි. ටී.ජී. ඩබ්ලිව්. සිල්වාගේ මුල්ම කෙටිකථා පළ වී ඇත්තේ දිනමිණ, සිළුමිණ ආදී පුවත්පත්වල ය. පත්පාඩගම, අවංක මිනිසා හා දේශපාලන කෙටිකථා, සිකුරු මඟුල, රූප රැජිනිය වැනි ඔහුගේ කෙටිකථාවල එන්නේ දේශපාලන කරළියට බැස සිටින උදවියගේ කපටිකම්, සිංහලයන්ගේ බොරු අලංකාරය, එකිනෙකා පරයා යන්නට ඇති ආසාව, සටකපටකම් වැනි ජාතික දුර්වලතා රාශියකි. බගලවතී ඉස්කෝලේ හාමිනේ, පණ්ඩිත ඔල්මොරොන්දම්, නාරි ගවේෂක වැනි චරිත ද පත්පාඩගම, කාකද්වීපය වැනි අමුතු දේශ ද නිර්මාණය කරගෙන සිල්වා විසින් රචිත උපහාසාත්මක කථා කියවීමට එක් කලෙක සිංහල පාඨකයන් ප්‍රිය කළ සැටි මහාචාර්ය කුමාරසිංහ තම කෘතියෙන් පෙන්වා දෙයි. කෙසේ වුවද ටී.ජී. ඩබ්ලිව් ද සිල්වාගේ කෙටිකථාවලින් ඉදිරිපත් කෙරෙන්නේ සියුම් උපහාසයක් නොවන බව ද ඔහු මැනවින් පෙන්වා දෙයි. එහෙත් සිල්වාගේ සරල උපහාසය පොදු ජනයා අතර එක් කලක ජනප්‍රිය වී තිබුණි.

ගුණදාස අමරසේකරගේ කෙටිකථා විමසීම සඳහා මහාචාර්ය කුලතිලක කුමාරසිංහ විසින් රචිත ග්‍රන්ථයෙහි ප්‍රකට ලෙස දක්නා ලැබෙන කරුණක් වන්නේ රුසියානු ලේඛකයන්ගේ කෘතිවලින් අභාසය ලැබීමට පමණක් නොව ඒවා අනුකරණය කිරීමට ද අමරසේකර උනන්දු වී ඇති අන්දම ප්‍රමාණවත් තරම් ප්‍රදර්ශනය නොවීමයි. නිදසුනක් වශයෙන් රතු රෝස මල නම් කෙටිකථා සංග්‍රහය ගැන ඔහු පළ කරන මත සඳහන් කළ හැකිය. මේ කෙටිකථා සංග්‍රහයේ එන කථාවලින් වැඩි ගණනක් රචනා කොට ඇත්තේ චෙකෝෆ්,

ගොගොල්, ගාර්ෂින් වැනි ලේඛකයන්ගේ කෘතිවලින් වස්තු පමණක් නොව රචනා රීතියට අයත් සමහර ලක්ෂණ ද අනුකරණය කරමිනි. මේ කරුණ අතින් හොඳම නිදසුන් සේ නම් කළ හැකි බයිසිකලය, අවුරුදු සිහිනය, අච්ච වැනි කථා විමසන විටවත් ඒවාට බැහැරින් ලැබී ඇති අභාසය ගැන සඳහන් නොවේ. මෙවැනි අනුකරණ රැගත් රතු රෝස මල කෙටිකථා සංග්‍රහය ගැන ආරම්භයේ දීම "පළමු කථා එකතුවෙන් ම ප්‍රතිභාසම්පන්න, කුසලතා පූර්ණ, කලාකරුවකු වශයෙන් කෙටිකතා කලාව නව මඟකට යොමු කිරීමට ඔහු සමත් වූ බැව් සියුම් විමර්ශනයකට හසුකරන විට පෙනේ." (පි.10) යන නිගමනයට මේ විචාරකයා පිවිසෙයි. මෙය පිළිගත හැකි නිගමනයක් නොවේ. රතු රෝස මලෙහි ඇත්තේ අනුකරණ රාශියක් වන හෙයිනි.

කෙසේ වුවද අමරසේකරගේ ඊළඟ කෘතිය වන ජීවන සුවඳ ස්වාධීන ලෙස රචිත කෙටිකථා සංග්‍රහයකි. මහාචාර්ය කුමාරසිංහ ජපන් බස හා සාහිත්‍යය පිළිබඳ ව තමන්ගේ ඇති දැනුම ද ගුණදාස අමරසේකරගේ කෙටිකථා පිළිබඳ ව කරන විමසීමේ දී ප්‍රයෝජනයට ගන්නා සැටි පෙනේ. ඔහු විසින් වෙනත් ග්‍රන්ථ විවේචනයට ලක් කරන විටද මෙය ප්‍රකට ලෙස පෙනුණු ලක්ෂණයකි. ගුණදාස අමරසේකරගේ ගල් පිළිමය හා බොල් පිළිමය කෙටිකථා සංග්‍රහයේ එන ඇමතිගේ අස්වීම නැමැති කෙටිකථාව ප්‍රකට ජපන් කෙටිකථා කරුවකු වූ ර්‍යූනොසුකෙ අකුතගවගේ 'ලැහැබක දී' නම් කෙටිකථාව සමග කරන සැසඳීම මේ සම්බන්ධයෙන් සඳහන් කළ හැකි තැනකි.

අමරසේකර සුහද ගැමි හැඟීම් පළ කරන අයුරින් ගැමි බස හික්මවන ආකාරය මෙහි එන හයවෙනි පරිච්ඡේදයේ දී විශේෂයෙන් ඉස්මතු කොට දැක්වේ.

ගුණදාස අමරසේකරගේ කෙටිකථාවලින් ප්‍රකට කෙරෙන දුර්වලතා පෙන්වාදීමට මේ විචාරකයා වෙත මැලිකමක් ඇද්දැයි මේ ග්‍රන්ථය කියවන පාඨකයෙකුට සිතෙන්නට හැකි වුවද එහි එන සමාලෝචනයෙන් ඉදිරිපත් කෙරෙන ඇතැම් කරුණුවලින් ඒ සැකය තුරන් වී යයි. තම කෙටිකථාවලින් විස්තර කෙරෙන ඇතැම් සිදුවීම් විකාසනයේ දී කාලය ගෙවී ගිය ආකාරය පැහැදිලි කිරීම සඳහා "කාලය ක්‍රමයෙන් ගෙවී ගියේ ය" වැනි පාඨ යොදා ගැනීමට අමරසේකරගේ ඇති කැමැත්ත එක් දුර්වලකමක් සේ මහාචාර්ය කුමාරසිංහ මෙහි සඳහන් කරයි. ප්‍රධාන කථා තේමාව නිරූපණය කිරීමට අදාළ නොවන සිදුවීම් පුනරුක්තියෙන් ඉදිරිපත් කිරීමට අමරසේකරගේ ඇති කැමැත්ත ද මෙහි සඳහන් වන තවත් දෝෂයකි.

නවකථාකරුවා මෙන් නොව කෙටි කථාකරුවා තම නිර්මාණවල දී වචන භාවිත කළ යුත්තේ අර පිරිමැස්සෙන් යුතුවය යන සම්මතය විචාරකයන් අතර පවතින්නකි. එහෙත් ඒ සම්මතය ගැන අමරසේකර තැකීමක් නොකරන සැටි මේ විචාරකයා පෙන්වා දෙයි.

කේ. ජයතිලකගේ කෙටිකථා සාකච්ඡා කිරීම සඳහා මිඩංගු කොට ඇති තම ග්‍රන්ථය සඳහා මහාචාර්ය කුලතිලක කුමාරසිංහ විසින් දී ඇත්තේ 'සමාජය, යථාර්ථය හා කෙටිකථාව' යන නමයි. මෙතෙක් ජයතිලක විසින් පළකොට ඇති පුනරුත්පත්තිය සහ තවත් කෙටිකථා කටු සහ මල්, වජිර පබ්බත, අතීරණය, එකගෙයි අවුරුද්ද හා නොනිමි සිත්තම සහ තවත් කෙටිකතා යන කෙටිකථා සංග්‍රහ සියල්ල පිළිබඳව මනා විග්‍රහයක් මේ කෘතියෙන් ඉදිරිපත් කෙරේ.

මෙහි පළමුවන පරිච්ඡේදයෙන් සාකච්ඡා කෙරෙන්නේ කේ. ජයතිලකගේ කෙටිකථාවලට පසුතලය වී ඇති ක්ෂේත්‍රය බව පෙනේ. ප්‍රධාන පෙළේ කෙටිකථාවලින් නිදසුන් සපයමින් මේ කාර්යය ඉටු කෙරේ. තමන් බසින නිගමනය ශක්තිමත් කිරීමට විචාරකයා අවශ්‍ය තන්හි දී කෙටිකථාවලින් පාඨ උපුටා දක්වයි. මෙම ග්‍රන්ථයේ දෙවන පරිච්ඡේදයෙන් චරිත නිරූපණය වෙත විශේෂයෙන් නැඹුරු වී ඇති බව කිව හැකිය. විවිධ සමාජ තලවලින් කැඳවන ලද චරිත තම කෙටිකථාවලින් විග්‍රහ කොට දක්වන අයුරු මෙහි සාකච්ඡා කොට ඇත්තේ ප්‍රකට විචාරකයන් විසින් දක්වා ඇති විචාර සිද්ධාන්ත ආදිය ගැන ද සඳහන් කරමිනි.

තුන්වන හා හතරවන පරිච්ඡේදවලින් ජයතිලකගේ ප්‍රධාන පෙළේ කෙටිකථා කිහිපයක් විස්තර සහිතව විග්‍රහ කොට දැක්වෙයි. අම්මා, ආවර්තනය, ගමනක අවසානය, ලේඛකයා යන කෙටිකථා මෙහිදී විශේෂ විමර්ශනයට ලක් කෙරේ.

මෙරට වර්තමාන සමාජයේ නොයෙක් පැති නියෝජනය කරන පුද්ගලයන්ගේ ජීවිත විවරණ හා සම්බන්ධ වී ඇති අත්දැකීම් මෙහි එන සිව්වැනි කොටසේ දී සාකච්ඡා වෙයි. ජයතිලක විසින් ම ලියා ඇති 'නූතන සිංහල නවකතාවට සංස්කෘතික හා දාර්ශනික පසුබිම' යන ග්‍රන්ථය ද මේ විග්‍රහයේ දී ප්‍රයෝජනවත් වී ඇති බැව් පෙනේ.

කේ. ජයතිලකගේ සමකාලීන වන ඇතැම් ලේඛකයන් බැහැරින් ආභාසය ලැබූ අන්දම ඉතා ප්‍රකටය. එහෙයින් ජයතිලකගේ කෙටිකථා පිළිබඳව නිරීක්ෂණය කරන විචාරකයන් ඔහු බැහැරින් ලැබූ ආභාසය කෙබඳු දැයි සොයා බැලීමට අදහස් කිරීම ස්වාභාවික ය. මහාචාර්ය කුමාරසිංහ තම කෘතියේ පස්වන පරිච්ඡේදයෙන් උත්සාහ කරන්නේ ඒ කාර්යය සිදු කිරීමට යි. ජයතිලක මඳ වශයෙන් රුසියානු ප්‍රංශ කෙටිකථා සම්ප්‍රදායවලින් පමණක් නොව අකුතගව වැනි ජපන් කෙටිකථා කරුවන්ගෙන් ද ආභාසය ලැබීමට ප්‍රිය කළ සැටි මෙහිදී පිරික්සීමට ලක්වෙයි. ජයතිලක ජාතක කථාවලින් ලැබූ ආභාසයක් ද වෙතැයි යන කරුණු ඒ තරම්ම ප්‍රකට නැත. මෙහිදී කරුණු ද සැකවින් විමසේ.

අකුතගව නම් ජපන් ලේඛකයාගෙන් ලද අභාසය පළ කරන කෙටිකථා දෙකක් ලෙසින් මෙහි දැක්වෙන්නේ ජයතිලකගේ අතීරණය



යන සංග්‍රහයෙහි එන 'සාක්කි තුනක්' නම් කථාවත් එකගෙයි අවුරුද්ද කථා සංග්‍රහයෙහි එන 'අනුන් කියූ කතාවක්' නම් නිර්මාණයත් ය. මේ දෙකට ආභාසය ලැබී ඇත්තේ අකුතගවගේ ප්‍රකට රෂෝමොන් නම් කෙටිකථාවෙන් බව අවශ්‍ය ලෙස චරිත හා සිද්ධි ගැන සඳහන් කරමින් මෙහිදී පැහැදිලි කෙරේ.

රුසියානු ආභාසය ලත් ජයතිලකගේ කෙටිකථාවකට නිදසුන් ලෙස මේ කෘතියේ නම් කොට ඇත්තේ ගිය ලූලා, පුනරුත්පත්තිය යන කථා දෙකයි. රීදී දම්වැල, සුමනක්කා වැනි කථාවල ජයතිලක ලැබූ ප්‍රංශ සම්ප්‍රදායේ ආභාසය මේ විචාරකයා දකී.

ජයතිලකගේ කෙටිකථාවල ඇතැම් විට පෙනෙන අඩුපාඩු ඉස්මතු කොට දැක්වීමට ද මහාචාර්ය කුමාරසිංහ මැලි නොවේ. මේ කාර්යය ඔහු සිදු කරන්නේ තම ග්‍රන්ථයේ සත්වන පරිච්ඡේදයෙනි. එවැනි එක් අඩු පාඩුවක් ලෙස මෙහි දක්වා ඇත්තේ ජයතිලක ඇතැම් විට තමා දන්නා කිසියම් ආප්තයක් හෝ සංකල්පයට නිදසුන් සැපයෙන ආකාරයෙන් කෙටිකථා ලිවීමට තැත් කිරීමයි. කිසියම් කෙටිකථාවක කාලය ගෙවී ගිය ආකාරය නිරූපණය කොට දැක්වීමට ජයතිලක ඇතැම්විට උනන්දු නොවන බවද විචාරකයා කියයි.

බැහැරින් ආභාසයක් ලබන්නට උත්සාහයක් නොකොට හැකි පමණින් ස්වාධීන ලෙසම කෙටිකථා නිර්මාණයෙහි යෙදුණු ලේඛකයෙකු ලෙසින් ඇරැව්වල නන්දිමිත්‍ර හැඳින්විය හැකි යි. මේ නිසා ම ඔහුගේ කෙටිකථාවලට පිවිසගෙන ඇති දුර්වලතා කිහිපයක් ද වෙයි. මින් එකක් වන්නේ කිසියම් කථාවක් ඉදිරිපත් කිරීමේ දී ඒවා විස්තරාත්මක කථනයෙන් යුක්තව විවරණය කොට දැක්වීමට ඇති උනන්දුවයි. ඇරැව්වල පැරණි කථාන්තර කියන්නෙකුගේ තත්ත්වයට පත් වී සිටින බව පෙනේ. එමෙන් ම තම කථාවලට පසුතලය වන සිද්ධිවලට ප්‍රධාන තැනක් දී ඇති නමුත් එම සිද්ධි ක්‍රියාත්මක කරවීමට හේතු වන ආර්ථික අර්බුද ඔහු මැනවින් හා ගැඹුරින් විග්‍රහ කොට නොදැක්වීම ද අඩුපාඩුවකි. මේ සියලු දුර්වලතා ද දක්නට ලැබෙන ප්‍රබලතා ද විමසමින් මහාචාර්ය කුමාරසිංහ විසින් රචිත 'ඇරැව්වල නන්දිමිත්‍ර කෙටිකථා විමර්ශන' නම් කෘතිය කෙටිකථා කලාව පිළිබඳ ව පාඨක ලෝකය වෙත වෙනත් ප්‍රයෝජනවත් කරුණු රාශියක් ද ගෙන එන්නකි. ඇරැව්වල විශේෂ ගණයකට පත් වී ඇති කෙටිකථාකරුවකු බව මේ කෘතියෙන් මැනවින් පැහැදිලි වෙයි. ඔහු විසින් රචිත කය මිස සිත නැති දන, රෝස මලේ රේණු හැලේ, සුදු කොඩි, ස්ත්‍රී, සුද්දෝ සහ කොයින් මැණිකේ, පුංචි කුමාරිහාමි, රත්තරන් නෙළුම් මල් ආදී සියලුම කථා විචාරයට ලක්කරන අතර අවශ්‍ය තන්හි දී කොටස් උපුටා දැක්වීමට ද විචාරකයා සැලකිලිමත් වන බව සඳහන් කළ යුත්තකි.

පොත් වශයෙන් ඉදිරිපත් කොට නැතත් වෙනත් බොහෝ කෙටි කථාකරුවන්ගේ නිර්මාණ ද මහාචාර්ය කුලතිලක කුමාරසිංහ විසින්

විමර්ශනයට ලක්කොට ඇති බව සඳහන් කළ යුත්තකි. එච්. ඒ . සෙනෙවිරත්න, දයාසේන ගුණසිංහ, කරුණා පෙරේරා, පියසීලි විජේමාන්න, පියදාස වැලිකන්නගේ, කුසුම් දිසානායක, සරත් විජේසූරිය, හේමරත්න ලියනාරච්චි, කිත්සිරි කාරියප්පෙරුම, රන්ජිත් ධර්ම කීර්ති, ලාල් පෙරේරා, සුනිල් ජේ. සේමසිංහ, ජයවඩුවිතාන, චන්‍ද්‍රරත්න බණ්ඩාර, බන්දුල පී. දයාරත්න, හද්‍රජී මහින්ද, ජයතිලක, කරුණාරත්න මාකඩුවාවගේ, සුගතානන්ද ලොකුගමගේ, බෝ. නන්දිස්සර හිමි, සේපාල සමරතුංග වැනි රචකයන්ගේ කෙටිකථා මේ අතර වෙයි. 'සිංහල කෙටිකතා සංවාද විමර්ශන' යන නමින් මහාචාර්‍ය්‍ය කුමාරසිංහ විසින් මෑත දී පළ කරන ලද කෘතියෙන් ද මේ ලේඛකයන් බොහෝ දෙනෙකුගේ කෙටිකථා විමර්ශනයට ලක්කෙරේ.

කෙටිකථා විමසීමේ දී මෙන්ම නවකථා, විමර්ශනයට ලක් කිරීමේ දී ද මහාචාර්‍ය්‍ය කුලතිලක කුමාරසිංහ දක්වන්නේ පැසසුම් කටයුතු වූ විචක්ෂණ බවකි. මේ සම්බන්ධයෙන් සඳහන් කළ හැකි එක් හොඳ නිදසුනක් වන්නේ 70 දශකයේ සිංහල නවකතා නම් කෘතිය යි. 70 දශකයේ දී ප්‍රකාශයට පත් වූ කලාත්මක බවින් ඉහළ මට්ටමකට පත්ව ඇති සියලුම සිංහල නවකථා මේ කෘතියෙන් විමර්ශනයට ලක් කෙරේ. ඒ සමගම නවකථාකරණය සම්බන්ධයෙන් ප්‍රකට දේශීය හා විදේශීය විචාරකයන්ගේ අදහස් අවශ්‍ය පරිදි උපුටා දැක්වීමට ද මේ විචාරකයා සැලකිලිමත් වෙයි.

කුමාරසිංහ සූරීන් විසින් නිරීක්ෂණයට ලක්කොට ඇති කෙටිකථා හා නවකථාවල කතුවරයන් ගැන සිතා බලනවිට පෙනී යන එක් කරුණක් වන්නේ ඔවුන්ගේ උස්මිටිකම් ගැන තැකීමක් නොකර නැගීගෙන එන ආධුනික මට්ටමේ ලේඛකයන්ගේ කෘති පවා සැලකිල්ලට ලක්කිරීමට ඔහු උනන්දු වී ඇති බවයි.

මහාචාර්‍ය්‍ය කුමාරසිංහ නොයෙක් ලේඛකයන්ගේ කෙටිකථා, සාකච්ඡා, කරද්දී පවා ඔවුන්ගේ නවකථා ගැන නිහැඬියාවක් අනුගමනය කළ බවක් නොපෙනේ. ඇතැම් ලේඛකයන් විසින් තම කෙටිකථාවලට වස්තු කරගෙන ඇති සිද්ධි හා චරිතවලට සමාන වූ සිද්ධි හා චරිත ඔවුන්ගේ නවකථාවලින් හමුවේ. එවැනි තැන් මේ විචාරකයා විසින් පෙන්වාදීමට උනන්දු වී ඇති සැටියෙන් තම පර්යේෂණ කාර්‍ය්‍යයේ දී ඔහු පළ කරන ගැඹුර මැනවින් පළ වෙයි. පහත දැක්වෙන්නේ 'අද්‍යතන සිංහල කෙටිකතා' යන කෘතියෙහි එවැනි තැනක් පිළිබඳව කරන සඳහනකි. මෙහි සැසඳීමට ලක්වන්නේ 'මගේ කථාව' නම් වික්‍රමසිංහගේ කෙටිකථා සංග්‍රහයෙහි එන 'සිංහල නඩුව' නම් කෙටිකථාවේ දී අපට හමුවන සිරිමල් මුදලාලිගේ චරිතය හා යුගාන්තය නවකථාවෙහි එන සයිමන් කබලානගේ චරිතය යි. "මේ කථාවේ කථකයා වන සිරිමල් සිංහල බස පිළිබඳ අවබෝධයක් නොමැති තම බෑණා මෙල්ල කරන අයුරු සිහිකරවන්නේ යුගාන්තයෙහි



සයිමන් කබලාන සුද්දන් මෙල්ල කරන ආකාරයත්, වත්තුහාමි මුදලාලි කොක්වත්තේ නඩුකාරයාගේ අහංකාරකම මැඩීමට කරගත් අධිෂ්ඨානයත් ය" (පි. 69).

නූතන ගද්‍ය සාහිත්‍යය පිළිබඳව මෙන්ම පද්‍ය සාහිත්‍යය පිළිබඳව ද පරිණත දැනුමක් ඇති කුමාරසිංහ සූරීන් විශේෂයෙන් උසස් විභාගවලට පෙනී සිටින්නන්ගේ ප්‍රයෝජනය තකා පළ කරන ලද 'නව කවිසරණිය විමර්ශන', 'සිංහල කාව්‍ය සංග්‍රහය විමර්ශන', 'නූතන පද්‍ය සංග්‍රහය-විමර්ශන' වැනි ග්‍රන්ථ පොදු පාඨකයන්ටත් කාව්‍යකරණය පිළිබඳ නව දැනුමක් ලබාදෙන බව පැහැදිලි ලෙස ම පෙනේ.

මහාචාර්‍ය්‍ය කුමාරසිංහ සතුව නිර්මාණකරණයෙහි ද සමත්කමක් ඇති සැටි 'නැත ලොවේ අන් රසඳුනා', 'කැලණි සරසවි කවි' වැනි කෘතිවලින් පෙනේ. එහෙත් ඔහු ඒ දෙසට නැඹුරු නොවී තම ප්‍රධාන කාර්යය සාහිත්‍ය විචාරය බවට පත්කර ගැනීමෙන් සිදුවූයේ සිංහල සාහිත්‍යය සම්බන්ධයෙන් කලක් තිස්සේ පැවැති විශාල අඩුවක් සම්පූර්ණවීම යි. ඒ අඩුව නම් නොයෙක් විදේශීය සාහිත්‍ය පිළිබඳව දැනුමකින් හා තියුණු බුද්ධි මහිමයකින් පරිපූර්ණ වූ සාහිත්‍ය විචාරකයෙකු නොමැති වීමයි. මහාචාර්‍ය්‍ය කුමාරසිංහ විසින් මේ දක්වා සිදුකොට ඇති මෙහෙය ගැන සැලකිලිමත් වනවිට පෙනී යන්නේ ඒ අඩුව දැන් සම්පූර්ණ වී ඇති බවයි. කැලණිය විශ්වවිද්‍යාලය අරඹා සතළිස් වසක් සම්පූර්ණ වන මේ වකවානුවෙහි මහාචාර්‍ය්‍ය කුලතිලක කුමාරසිංහ පිළිබඳ ව මෙවැනි නිගමනයකට එළඹීමට හැකිවීම ඒ විශ්වවිද්‍යාලය හා යම් සම්බන්ධයක් ඇති සියල්ලන්ගේ ම ඉමහත් ප්‍රීතියට හේතුවන කරුණක් විය යුතු ය. ඊට හේතුව නම් මහාචාර්‍ය්‍ය කුමාරසිංහ උගතෙකු බවට පත් වී, අනතුරුව ශ්‍රේෂ්ඨ ගණයේ විචාරකයෙකු ලෙසින් සිංහල සාහිත්‍යය ක්ෂේත්‍රයට පිවිසියේ ප්‍රධාන වශයෙන් කැලණිය විශ්වවිද්‍යාලයේ ඇසුරින් ම වන හෙයිනි.